# බටහිර ඇසින් සිංහල අනන්‍යතාව

විදුසර විසිඑක් වැනි වියට පා නගන්නේ බටහිරයන් දැනුම් කළමණාකරණය එක් තලයක සිර තවත් තලයකට ඔසවන අවස්ථාවක ය. විදුසරට මේ විසිඑක් වැනි විය වුව ද බටහිරයන්ට මේ විසිඑක් වැනි සියවස වෙයි. විසිඑක් වැනි සියවස යන ව්‍යවහාරය පවා බටහිර දැනුම් කළමණාකරණයෙහි (ආධිපත්‍යයෙහි) ප්‍රතිඵලයක් වෙයි. බටහිරයන් මෙරටට නොපැමිණෙන්නට අප දැන් සිටින්නේ විසිඑක් වැනි සියවසේ නොව විසිහය වැනි සියවසේ ය. ඒ බුද්ධ වර්ෂයෙනි. බටහිරයන් අප සියවස් පහකින් පස්සට ඇද දමා ඇත. බුද්ධ වර්ෂය අනුව නම් පෘතුගීසීන් (බටහිරයන්) අප රටට පැමිණ ඇත්තේ විසිඑක් වැනි සියවසෙහි ය. එහෙත් අපි තවමත් බටහිරයන්ට අනුව විසිඑක් වැනි සියවසෙහි පසු වෙමු! බටහිරයන් මේ විසිඑක් වැනි සියවස බවට පත්කර ඇත්තේ සවිඥානික ව දැනුම් කළමණාකරණයක් කිරීමෙන් නො වේ. බටහිර ක්‍රිස්තියානි නතනත්ව ව්‍යාපෘතියෙහි දේශපාලන ආධිපත්‍යය යටතෙහි ඒ සංස්කෘතික වෙනස සිදුකෙරී ඇත. අද බටහිරයෝ සවිඥානිකව ම සංස්කෘතික යටත්විජිතවාදය පෙරදැරි කරගෙන දැනුම් කළමණාකරණයක යෙදී සිටිති.

බටහිර ක්‍රිස්තියානි නූතනත්ව යටත්විජිතවාදයෙහි ප්‍රතිඵලයක් ලෙස තිබූ දැනුම් ආධිපත්‍යය ඒ යටත්විජිතවාදයෙහි සංස්කෘතික සංරචකය ඔස්සේ දැනුම් කළමණාකරණයක් වීම තවමත් ඇත්තේ ළදරු අවස්ථාවක ය. යම් අයුරකින් එයට වැඩී යැමට ඉඩ දුනහොත් අප මහත් අසීරුතාවකට පත්වනු ඇත. බටහිර දැනුම් ආධිපත්‍යය තවමත් ප්‍රධාන වශයෙන් ම බටහිර විද්‍යාව ඔස්සේ ම ක්‍රියාත්මක වෙයි. බටහිර සමාජයීය විද්‍යාවන්ට හෝ මානව ශාස්ත්‍රවලට හෝ තවමත් බටහිර විද්‍යාවේ, එනම් බටහිර ස්වාභාවික විද්‍යාවන්ගේ (natural sciences) තත්වයට පත්වීමට නොහැකි වී ඇත. එබැවින් බටහිර සමාජයීය විද්‍යාවන්ට (social sciences) බටහිර (ස්වාභාවික) විද්‍යාවන් ආකාරයට ආධිපත්‍යය පැතිරවීමේ හැකියාවක් ලැබී නැත. එසේ වුවත් බටහිර ක්‍රිස්තියානි නූතනත්ව යටත්විජිතවාදය තම ආධිපත්‍යය යොදාගනිමින් බටහිර සමාජයීය විද්‍යාවන්හි තමන්ට අවශ්‍ය මතවාදයක් අනෙක් අය මත පටවයි. බටහිර සමාජයීය විද්‍යාඥයන් එසේ කරන්නේ කබරගොයා තලගොයා කරගැනීමෙනි. අප මෙයට කිසිසේත් ඉඩදිය යුතු නො වේ. බටහිර සමාජයීය විද්‍යාවන් යනු බටහිර (ස්වාභාවික) විද්‍යාවන් පසුපස නොන්ඩි ගසන අසාර්ථක විද්‍යාවන් (failed sciences) බව අභියෝගාත්මක ව පෙන්වා දිය යුතු ය.

බටහිර සමාජයීය විද්‍යාවන්ට ප්‍රශ්නය වී ඇත්තේ බටහිර විද්‍යාවන්හි මෙන් ඊනියා වාස්තවික දැනුමක් ගොඩනගා ගැනීමට නොහැකි වීම ය. අඩුම තරමින් යම් කාල පරිච්ඡේදයක හෝ බටහිර බොහෝ සමාජයීය විද්‍යාඥයන්ට එකඟ විය හැකි දැනුමක් නිර්මාණය කරගැනීමේ අපහසුතාව වෙයි. එයට හේතු කිහිපයක් වෙයි. ඒ හේතු අතර ඊනියා වාස්තවික දැනුම පිළිබඳ ප්‍රශ්නය ප්‍රධාන තැනක් ගනියි. ඊනියා වාස්තවික දැනුම ගොඩනගා ගැනීමේ දී බලපාන ප්‍රධාන සාධකයක් වනුයේ වියුක්ත සංකල්ප නිර්මාණය කිරීම ය. බටහිර (ස්වාභාවික) විද්‍යාවන්හි මෙන් නොව බටහිර සමාජයීය විද්‍යාවන්හි වියුක්ත සංකල්පයක් ගොඩනගා ගැනීමට තැත්කිරීමේ දී විවිධ ප්‍රශ්නවලට මුහුණ පෑමට සිදුවෙයි.

අපි උදාහරණ කිහිපයක් ගනිමු. බටහිර භෞතික විද්‍යාවෙහි වායුව යනුවෙන් සංකල්පයක් වෙයි. මෙහි දී වායුව යනුවෙන් අදහස් කරන්නේ ඔක්සිජන් හෝ වෙනත් යම් වායුවක් හෝ නොව ඕනෑම වායුවකි. සාමාන්‍යයෙන් ගතහොත් වායු ගුණ යැයි සඳහන්වන ගුණ ඇති වස්තුවකට වායුවක් යැයි කිව හැකි ය. ඇතැම් සීමා යටතේ බොයිල්ගේ නියමය මේ ඕනෑම වායුවක් සඳහා වලංගු වෙයි. ඒ සීමාවලින් පිටතට ගිය කල බොයිල්ගේ නියම වලංගු නො වෙයි. බටහිර (ස්වාභාවික) විද්‍යාඥයෝ සියළු දෙනාම පාහේ වායුවක් යන්නෙන් කියැවෙන්නේ කුමක් ද යන්න පිළිබඳ එකඟත්වයකට පැමිණෙති.

එහෙත් බටහිර සමාජයීය විද්‍යාඥයන්ට ජාතියක් යනුවෙන් යමක් පවතින්නේ ද යන්න පිළිබඳ ව එකඟත්වයකට පැමිණීමට නොහැකිව ඇත. එමෙන් ම සංස්කෘතිය යන්නෙන් කියැවෙන්නේ කුමක් ද යන්න පිළිබඳවත් බටහිර සමාජයීය විද්‍යාඥයන් අතර එකඟත්වයක් නැත. ජාතියක් යනුවෙන් සංසිද්ධියක් (phenomenon) නැතැයි ඇතැම් බටහිර සමාජයීය විද්‍යාඥයන් තර්ක කරන්නේ ජාතියකට අයත් වියුක්ත මිනිසා නිර්වචනය කිරීමට නොහැකි යැයි

© Prof. Nalin De Silva

කියමිනි. ඔවුන්ට අනුව ජාතියකට අයත් මිනිසුන්ට පොදු වූ ගුණ හඳුනාගත නො හැකි ය. එහෙත් ඔවුහු මිනිසා යනුවෙන් වියුක්ත සංකල්පයක් ගොඩනගා ගනිති!

අපි උදාහරණයකට සිංහලයන් යන්න සනිමු. බටහිර ඇතැම් සමාජ විද්‍යාඥයන්ට අනුව දකුණු පළාතේ ජීවත්වන සිංහලයකුගේ භාෂාව උඩරට සිංහල ගැමියකුගේ භාෂාවෙන් වෙනස් වෙයි. වචන උච්චාරණය අතින් මෙන් ම යොදාගන්නා වචන අතින්ද ඔවුහු වෙනස් වෙති. එසේ වූ විට සිංහලයා යනු කවුදැයි ඔවුහු ප්‍රශ්න කරති. සිංහලයා යනු දකුණු පළාතේ සිංහලයා ද, එසේත් නැත්නම් උඩරට සිංහලයා ද, එසේත් නැත්නම් වන්නියේ හෝ දැදුරු ඔය අසවඩ හෝ සිංහලයා ද යනුවෙන් ඇතැම් බටහිර සමාජයීය විද්‍යාඥයෝ ප්‍රශ්න කරති. අනෙක් පැත්තෙන් ඔවුහු සිංහල අනන්‍යතාව කුමක් දැයි ප්‍රශ්න කරති. සිංහල කතාකරන නිසා සිංහලයකු වන්නේ ද? එසෙත් සිංහල කතාකරන අය වෙනත් විවිධ කුලකවලට ද අයත්වන බව ඔවුහු පෙන්වා දෙති. සිංහලයන්ගෙන් ඇතැමකු බටහිර වෛද්‍යවරුන් වන අතර තවත් සමහරු ගායකයෝ වෙති. එසේත් නැත්නම් නීතිඥයෝ, කළමණාකරුවෝ, ඉංජිනේරුවෝ වෙති. ඒ ඒ වෘත්තියෙහි විවිධ අනන්‍යතා ඇත. එබැවින් පොදු සිංහල අනන්‍යතාවක් ලබාගන්නේ කෙසේ දැයි ඔවුහු ප්‍රශ්න කරති.

එහෙත් මේ ප්‍රශ්න ඇසීම් සැමවිට ම නොකිරීමට ද ඔවුහු වගබලා හතිති. ඒ කබරගොයා තලගොයා කරගනිමිනි. බටහිර සමාජයීය විද්‍යාඥයෝ අවස්ථාව පරිදි එවැනි කබරගොයා තලගොයා කරගැනීමේ ව්‍යාපෘතිවල යෙදෙති. සිංහල යනුවෙන් ජාතියක් නොමැති යැයි කියන මේ සමාජයීය විද්‍යාඥයෝ ඊනියා ජනවාර්ගික අර්බුදයක් ගැන කතාකරති. ජනවාර්ගික අර්බුදයක් ගැන කීමට ජනවර්ග තිබිය යුතු ය. ලංකාවේ නම් අඩුම තරමින් සිංහල, දෙමළ ජනවර්ග තිබිය යුතු ය. එයට අමතර ව මුස්ලිම් ජනවර්ගයක් ගැන ද කියැවෙයි. එසේ නම් බටහිර සමාජයීය විද්‍යාඥයන්ට අනුව සිංහල නමින් ජනවර්ගයක් වෙයි.

සිංහල නමින් ජනවර්ගයක් වේ නම් අඩුම තරමින් සිංහල ජනවාර්ගික අනන්‍යතාවක් ඇත. ඒ සිංහල ජනවාර්ගික අනන්‍යතාව දකුණු පළාතේ සිංහලයන්ගේ ද, එසේත් නැත්නම් උඩරට සිංහලයන්ගේ ද, නොඑසේ නම් නුවර කලාවියේ සිංහලයන්ගේ ද? පැහැදිලිව ම සිංහල ජනවර්ගයක් ඇත්නම් ඒ පොදු අනන්‍යතාවක් මිස සිංහල නීතිඥයන්ගේ හෝ සිංහල ඉංජිනේරුවන්ගේ හෝ දකුණු පළාතේ සිංහලයන්ගේ හෝ වෙනත් එවැනි උපකුලකයක හෝ අනන්‍යතාව නො වෙයි. එසේ සිංහල ජනවාර්ගික අනන්‍යතාවක් ඇත්නම් සිංහල ජාතික අනන්‍යතාවක් නැතිවන්නේ ඇයි?

මේ ප්‍රශ්නයට බටහිර සමාජයීය විද්‍යාඥයන්ට විවිධ පිළිතුරු දිය හැකි ය. ජාතියක් වීමට ජනවර්ගය ඉක්මවා යන තවත් නිර්ණායක සපුරාලිය යුතු ය යන්න එක්තරා අන්දමක ඊනියා ශාස්ත්‍රීය පිළිතුරකි. එහෙත් අර කලින් සඳහන් කළ දකුණු පළාතේ සිංහලයකු උඩරට සිංහලයකුගෙන් වෙන්වන්නේ ය, එබැවින් පොදු සිංහල අනන්‍යතාවක් නැත ආදී කතා නම් වලංගු නො වේ. ජාතියක් වීම සඳහා තවත් නිර්ණායක සපුරාලිය යුතු යැයි කියා සංගත නොවන නිර්ණායක ගෙන ඒම ප්‍රශ්නයට පිළිතුරක් නො වේ. උදාහරණයක් ලෙස ගතහොත් ජාතියක් ඇතිවිය හැක්කේ ධනපති ක්‍රමය වර්ධනය වීමෙන් පසුව ය යනුවෙන් ඇතැම් මාක්ස්වාදීන් සඳහන් කරන නිර්ණායකය ගනිමු. මේ නිර්ණායකයේ ප්‍රශ්නයක් ඇත. එනම් ජාතියක් ඇතිවීම සඳහා ධනපති ක්‍රමය කෙතෙක් වර්ධනය විය යුතු ද යන්න ය. ඒ වර්ධනය කෙතෙක් ද යන්න තීරණය කරන්නේ කවු ද? එයට ඇත්තේ එකම පිළිතුරක් පමණකි. ඒ බටහිරයන් විසින් තීරණය කෙරෙනු ඇත.

බටහිරයන්ට අනුව ජාතික රාජ්‍ය ඇත. එහෙත් මෙහි ජාතික යන්න නිර්වචනය කර නැත. ඒ බලෙන් රිංගවන ලද පදයකි. රාජ්‍යයක පුරවැසියන්ගෙන් ජාතියක් සමන්විත වන්නේ යැයි කියනු ලැබෙයි. ජාතිය යන්න රාජ්‍යය ආශ්‍රයෙන් මිස රාජ්‍යය යන්න ජාතිය ආශ්‍රයෙන් නො කියැවෙයි. රාජ්‍යය යන්න අවසානයේ දී තීරණය කෙරෙන්නේ එහි වපසරිය කෙතරම් දුරට අචල ද, ස්ථිර ද යන්න මත ය. එයට හේතුවක් විය. මධ්‍යකාලීන වැඩවසම් යුරෝපයෙහි රාජ්‍යයට ස්ථිර දේශ සීමා නො වී ය. රජ පවුල්වල විවාහවල දී දේශ සීමා වෙනස් වුයේ කුමරියන්ගේ දෑවැද්දට ජනතාව ද සමගින් බිම් පෙදෙස් දීම නිසා ය.

© Prof. Nalin De Silva

රාජ්‍යය එලෙස ස්ථිර ලෙස නිශ්චිත ව වෙන් කෙරුණු භූමි ප්‍රදේශයකින් සමන්විත වීම බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට එකඟ ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් එලෙස ක්‍රමයෙන් රාජ්‍ය ලකුණු කිරීම සිදුවිය යුත්තකි. ධනපති ක්‍රමය ඇතිවූයේ ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස බැවින් ඇතැමකුට ජාතික රාජ්‍යය ධනපති ක්‍රමයෙහි ප්‍රතිඵලයක් ලෙස පෙනී යෑම න්‍යායානුකූල (logical) නොවූවත් එසේ වන්නේ ඇයි දැයි තේරුම් ගැනීම අපහසු නො වේ. එහෙත් ඉහත සඳහන් පරිදි ඒ ඔස්සේ ජාතිය යන්න නිර්වචනය කිරීමේ දී ප්‍රශ්න මතුවෙයි. අවසානයේ දී ජාතියක් වේ ද නැද්ද යන්න තීරණය කෙරෙනුයේ බටහිරයන්ට අවශ්‍ය ආකාරයට ය. දැනුම් ආධිපත්‍යය ඇත්තේ ඔවුන්ට බැවින් බොහෝ දෙනා නොයෙකුත් හේතු නිසා ඒ පිළිගනිති.

ලංකාවේ දී එක්කෝ ජාතියක් යනුවෙන් ප්‍රපංචයක්, සංසිද්ධියක් නැතැයි යන අරුතින් නැත්නම් නිශ්චිත සිංහල ජාතික අනන්‍යතාවක් සොයාගැනීමට නැත යන තේරුමෙන්, සිංහල ජාතියක් ලෙස නොපිළිගැනී, එහෙත් සිංහල ජනවර්ගයක් ඇතැයි යන නිගමනයට බටහිරයන් පැමිණෙන්නේ සිංහලයන්ට මෙරට හිමි තැන අහිමිකිරීම සඳහා ය. දෙමළ යනුවෙන් ජාතියක් ලංකාවේ තබා දකුණු භාරතයේවත් කිසි දිනෙක තිබී නැත. ඒ බව බටහිරයෝ හොඳාකාරව ම දනිති. දෙමළ යනු ලංකාවේ ද වර්තමාන ඉන්දියාවේ ද, ජනවර්ගයක් පමණකි. එබැවින් බටහිරයෝ සිංහලයන් ද ජනවර්ගයක් පමණක් බවට පෙන්වීමට උත්සාහ කරති. ඒ සඳහා අවශ්‍ය ඊනියා සාධක ඉදිරිපත් කරති. ඉතා පැහැදිලිව මෙහි දී බටහිර දැනුම් ආධිපත්‍යය ක්‍රියාත්මක වෙයි. එපමණක් නොව එහි දැනුම් කළමණාකරණයක් ද වෙයි. බටහිරයෝ යුරෝපයට අවශ්‍ය ආකාරයට ජාතියක් ඇතැයි යන දැනුම ද ලංකාව සහ වෙනත් එවැනි රටවලට බලපාන අයුරින් ජාතියක් නැත එහෙත් ජනවර්ගයක් ඇත යන ආදී දැනුම ද නිර්මාණය කර කළමණාකරණය කරති. බටහිරයන් ලංකාව වැනි රටබලට දැනුම පමණක් නොව වෙනත් භාණ්ඩ අපනයනය කිරීමේ දී ද එවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කරති. බටහිරයන් පමණක් නොව ඔවුන් මෙන් වැඩකරන ජපානය ද එසේ කරයි. ජපානය ඒ රටෙහි ප්‍රයෝජනය සඳහා නිෂ්පාදනය කරන මෝටර් රථ අප රටට අපනයනය නො කරයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva